**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2013**
---------------------------------------------------------------------------

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යන ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1971 අංක 38 දරන මුදල් පනත** | |
| (i) 10(5) වගන්තිය | තාවකාලික අතිරික්ත මුදල්, ඉල්ලූ විට නැවත ලබා ගැනීම සඳහා මහ භාණ්ඩාගාරයේ තැන්පත් කළයුතු වුවත්, ප්‍රවර්ථන වර්ෂයේ රු.12,733,876 ක අතිරික්තය තැන්පත් කර නොතිබුණි. |
| (ii) 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතියකින් තොරව රු.9,253,244 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 103(1)(ඉ), 104(1)(අ), 104(4) සහ 105(1)(ඇ) | 2012 අප්‍රේල් 23 දින අස්ථානගත වූ ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | ආයතනයේ ඇති පුස්තකාල පොත් භාණ්ඩ සමීක්ෂණයට යොමු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | ආයතනය විසින් පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,722,049 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.11,001,880 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,720,169 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. අතිරික්තය වැඩිවීම කෙරෙහි විවිධ පාඨමාලා ආදායම සියයට 92 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 මූල්‍ය සමාලෝචනය**

2012 වර්ෂයේදී ආදායම් වලට වියදම් අනුපාතය සියයට 34 ක් වුවත් එය 2013 වර්ෂයේදී සියයට 43 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර පෙර වර්ෂයට වඩා මේ වර්ෂයේ ආදායම් ඉපයීම රුපියල් මිලියන 5.8 කට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 විධිමත් පරිදි පවරා නොගත් දේපල**

ආයතන පරිශ්‍රය පිහිටුවා ඇති ඉඩම සහ ගොඩනැගිලි කම්කරු දෙපාර්තමේන්තුවට අයත් වූවක් වන අතර අදාල දේපල පවරා ගැනීමට හෝ ගිවිසුම් ගත බැදීමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරු 13ක අනුමත සේවක සංඛ්‍යාව 25ක් වන අතර වර්ෂ කිහිපයක සිට පැවති පුරප්පාඩු 15ක් පිරවීමට විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) එම පුරප්පාඩු අතරින් සෞඛ්‍ය හා ස්වස්ථතා නිලධාරීන් මෙම ආයතනයේ අරමුණ ඉටුකර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නිලධාරීන් වුවත් එම නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:1 ඡේදය ප්‍රකාරව වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2010 සිට ආයතනයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබූ අතර 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 පෙබරවාරි 28 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සැලසුම් කිරීම.
(ආ) මූල්‍ය කළමනාකරණය.
(ඇ) කාර්යමණ්ඩල පරිපාලනය.
(ඈ) වාහන පරිපාලනය.